# වාර්ෂික වාර්තාව

# 2021

ශ්‍රී ලංකා ඉංජිනේරුවරුන්ගේ සභාව

# පටුන


| | පිටු අංකය |
|---|---|
| දැක්ම හා මෙහෙවර | 2 |
| හැඳින්වීම | 3 |
| ආයතනික තොරතුරු | 4 |
| සටහන | 5 |
| ශ්‍රී ලංකා ඉංජිනේරු සභාව සහ එහි ජාතික වගකීම | 5 |
| ශ්‍රී ලංකා ඉංජිනේරු සභාවේ කාර්යයන් | 5 |
| ඉංජිනේරු වෘත්තිකයන් අයත් කාණ්ඩ සහ සුදුසුකම් | 6 |
| සභාපතිතුමාගේ පණිවිඩය | 7 |
| සභාව | 9 |
| කාර්ය මණ්ඩලය | 10 |
| සභාවේ රැස්වීම් වාර | 10 |
| සම්පූර්ණ කර ඇති සහ සිදු කරමින් පවතින ක්‍රියාකාරකම් | 11 |
| සම්පූර්ණ කර ඇති  ක්‍රියාකාරකම් | 11 |
| සිදු කරමින් පවතින ක්‍රියාකාරකම් | 12 |
| මූල්‍ය ප්‍රකාශනය | 13 |
| විගණන වාර්තාව | 22 |

## දැක්ම

ශ්‍රී ලංකාවේ ඉංජිනේරු වෘත්තිකයන් කෙරෙහි මහජන විශ්වාසය තහවුරු කිරීම සහ රටේ සමාජ-ආර්ථික සංවර්ධනය සඳහා ක්‍රියාකාරී දායකයෙකු වීම.

## මෙහෙවර

ජාත්‍යන්තරව පිළිගත්, දේශීය වශයෙන් අදාළ වන ප්‍රමිති, නිපුණතාවය සහ රටේ සංවර්ධනය උදෙසා වෘත්තීමය කැපවීම පවත්වාගෙන යාම හා නීත්‍යානුකූලව පැවරී ඇති බලතල අනුව ශ්‍රී ලංකාවේ ඉංජිනේරු වෘත්තිකයන් විවිධ කාණ්ඩවල ලියාපදිංචි කිරීම.

## හැඳින්වීම

2017 මාර්තු 10 දිනැති ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජන රජයේ ගැසට් පත්‍රයේ II කොටසට අතිරේකයක් වශයෙන් පල කරන ලද 2017 අංක 04 දරණ ශ්‍රී ලංකා ඉංජිනේරු සභා පනත යටතේ ශ්‍රී ලංකා ඉංජිනේරු සභාව (ECSL) ස්ථාපනය කර ඇත.

මෙම පනත මගින්,

- ඉංජිනේරු වෘත්තිකයන්ගේ වෘත්තීමය තත්වය හා චර්යාව පවත්වාගෙන යාම සහ මෙහෙයවීමේ වගකීමටද
- ඉංජිනේරු වෘත්තිකයන් ලියාපදිංචි කිරීමටද
- ඒ හා සම්බන්ධ කාරණා හෝ ඊට අනුෂාංගික කරුණු සඳහා විධිවිධාන සැලසීමටද ශ්‍රී ලංකා ඉංජිනේරු සභාවට බලය පවරනු ලබයි.

ඉංජිනේරු වෘත්තිකයන් ලියාපදිංචි කිරීම

පනත අනුව සියළුම ඉංජිනේරු වෘත්තීකයන් ශ්‍රී ලංකා ඉංජිනේරු සභාවේ ලියාපදිංචි විය යුතුය. පනතේ අර්ථ නිරූපනය කර ඇති පරිදි ඉංජිනේරු වෘත්තිකයන් අයත් වන කාණ්ඩ

- වරලත් ඉංජිනේරු
- ආශ්‍රිත ඉංජිනේරු
- අනුබද්ධ ඉංජිනේරු
- සංස්ථාගත ඉංජිනේරු
- ඉංජිනේරු ඩිප්ලෝමාධාරී
- ඉංජිනේරු කාර්මික

ශ්‍රී ලංකාව තුල සේවයේ යෙදෙන විදේශීය ඉංජිනේරු වෘත්තියකයින්, මාස හතරක කාල සීමාවක් සඳහා තාවකාලික ලියාපදිංචි කිරීමේ කටයුතු ශ්‍රී ලංකා ඉංජිනේරු සභාව වෙත පැවරී තිබේ. එම ලියාපදිංචි කාලසීමාව අවසානයේදී නැවත අලුත් කළ හැකි වන්නේය.

# ආයතනික තොරතුරු

සංවිධානයේ නම
ශ්‍රී ලංකා ඉංජිනේරු සභාව

නෛතික ස්වරූපය
රජයට අයත් නියාමන ආයතනයකි.

ස්ථාපනය කරන ලද වසර
2017 අංක 4 දරණ පාර්ලිමේන්තු පනත මගින් 2017 වසරේ දී

රේඛීය අමාත්‍යාංශය
වාරිමාර්ග අමාත්‍යාංශය

ආරම්භ කල දිනය
2018 අගෝස්තු 24

නීති උපදේශක
රුවනි හපුආරච්චි මහත්මිය

ප්‍රධාන කාර්යාලය
4 වන මහල, වාරිමාර්ග දෙපාර්තමේන්තු පරිශ්‍රය
230, බෞද්ධාලෝක මාවත, කොළඹ 07
දුරකථන අංකය - 0112588811
ෆැක්ස් අංකය - 0112588010
ඊ මේල් - registrar@ecsl.gov.lk
Web site – www.ecsl.gov.lk

බැංකු කරුවන්
ලංකා බැංකුව

බදු හඳුනා ගැනීමේ අංකය
102769228

පනත අනුව පාර්ශවකරුවන්
ශ්‍රී ලංකා ඉංජිනේරු ආයතනය
ශ්‍රී ලංකා සංස්ථාගත ඉංජිනේරු ආයතනය
තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව
විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව

# සටහන

## ශ්‍රී ලංකා ඉංජිනේරු සභාව සහ එහි ජාතික වගකීම

ශ්‍රී ලංකා ඉංජිනේරු සභාව ස්ථාපිත කිරීම මවුබිමේ ගෞරවණීය ඉංජිනේරු වෘත්තීය සඳහා වූ පෙර නොවූ විරූ සුවිශේෂී සන්ධිස්ථානයක් විය. එය ප්‍රාග් ඓතිහාසික යුගවල සහස්‍ර කිහිපයක් දක්වා විහිදෙන ප්‍රත්‍යක්ෂ මූලයන්ගෙන් සමන්විතය. කලක සිට ලොව පුරා ඉංජිනේරු වෘත්තියේ සමකාලීන සමස්ථිතික අභිලාශයන් අනෙකුත් දියුණු ජාතීන් ක්‍රියාවට නංවන ආකාරයටම සංවිධානාත්මකව නියාමන මෙන්ම නියෝජන ජාතික ආයතනයක් ස්ථාපනය කිරීමේ ජාතික අවශ්‍යතාවය පිළිබඳව සිහි ගන්වමින් ශ්‍රී ලාංකීය ඉංජිනේරු වෘත්තීය කෙරෙහි පූර්ණ අවධානය යොමු කරමින් සිටියි.

පාර්ශවකරුවන් අතර සහ ජාතික නායකත්වය සමඟ දීර්ඝ කාලීන සාකච්ඡා සහ විවිධ අවස්ථාවල දී පැවති රජයන්ගෙන් ලැබුණු යහපත් අනුග්‍රාහක දායකත්වය යන කරුණු සියල්ල අවසනයේ 2017 වර්ෂයේ දී ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව විසින් සම්මත කරන ලද පාර්ලිමේන්තු පනතක් මගින් අවශ්‍ය නෛතික බලය ලබා දීම සිදු කර ඇත.

එසේ ස්ථාපනය කරණ ලද ශ්‍රී ලංකා ඉංජිනේරු සභාව ඉංජිනේරු වෘත්තිය නියාමනය කිරීම සඳහා ඉහලම ආයතනය බවට පත් වෙමින් ජාතික නායකත්ව සැපයීමේ සුවිසල් වගකීම එදින සිටම පැවරී ඇත. කෙටියෙන් සඳහන් කරනවා නම්, පිළිගත් සුදුසුකම් දරන්නා වූ ඉංජිනේරු වෘත්තිකයන් ලියාපදිංචි කිරීමේ කටයුතු සිදු කිරීම එම වෘත්තිකයන්ගේ යම් වෘත්තිමය විශමාචාර ක්‍රියාවන් පිළිබඳ විමර්ෂන සිදු කිරීම සහ ශ්‍රී ලංකාව තුල ඉංජිනේරු වෘත්තියේ යෙදීමට අදාල කාරනා පිළිබඳව රජය සහ අනෙකුත් ආයතනවල නියෝජනයන් සිදු කිරීම සඳහා එම ආයතනයට නෛතික බලය පැවරී ඇත.

## ශ්‍රී ලංකා ඉංජිනේරු සභාවේ කාර්යයන්

පහත සඳහන් කාර්යන් ඉටු කිරීම සඳහා ශ්‍රී ලංකා ඉංජිනේරු සභාවට බලය පවරනු ලැබ ඇත.

- ඉංජිනේරු වෘත්තිකයන්ගේ වෘත්තීය තත්වයන් පවත්වාගෙන යාම.
- ඉංජිනේරු වෘත්තිකයන්ගේ වෘත්තීය චර්යාවන් පවත්වාගෙන යාම.
- ඉංජිනේරු වෘත්තිකයන් කාණ්ඩ 06 ක් යටතේ ලියාපදිංචි කිරීම.
- ශ්‍රී ලංකාව තුල ඉංජිනේරු වෘත්තියෙහි නියලීමට අදාල කාරනා පිළිබඳ රජය සහ අදාල ආයතනන්හි නියෝජනයන් සිදු කිරීම.
- ඉංජිනේරු වෘත්තිකයන්ගේ ලියාපදිංචි ලේඛන පවත්වාගෙන යාම.
- ලියාපදිංචි කරන ලද ඉංජිනේරු වෘත්තිකයන්ගේ ලැයිස්තුව වරින් වර ප්‍රසිද්ධ කිරීම
- ඉංජිනේරු වෘත්තිකයන්ගේ වෘත්තීමය විෂමාචාර ක්‍රියාවන් සම්බන්ධයෙන් විමර්ශන පැවැත්වීම.
- සභාවේ කාර්ය මණ්ඩලයට ගෙවිය යුතු වේතන නිර්ණය කිරීම
- ලියාපදිංචි කිරීම සම්බන්ධයෙන් ගෙවිය යුතු ගාස්තු නිර්ණය කිරීම
- ලියාපදිංචි සහතික නිකුත් කිරීම
- ඉංජිනේරු වෘත්තිකයන්ගේ ගුණාත්මක භාවය ඉහල නැංවීමට අවශ්‍ය වන වෙනත් යම් කවර වූ කාරණයක්.
- ඊට සම්බන්ධ හෝ ඊට අනුෂාංගික කරුණු සම්බන්ධයෙන් විධිවිධාන සැලසීම

# ඉංජිනේරු වෘත්තිකයන් අයත් කාණ්ඩ සහ සුදුසුකම්

(2017 අංක 4 දරණ ඉංජිනේරුවන්ගේ සභාව පනතේ 15 වන වගන්තියේ 'අ' උපලේඛනය අනුව)

වරලත් ඉංජිනේරු

1968 අංක 17 දරණ ශ්‍රී ලංකා ඉංජිනේරු ආයතනය පනත මගින් පිහිටුවන ලද ශ්‍රී ලංකා ඉංජිනේරු ආයතනයේ වරළත් ඉංජිනේරුවරයෙකු වීම.

ආශ්‍රිත ඉංජිනේරු

1968 අංක 17 දරණ ශ්‍රී ලංකා ඉංජිනේරු ආයතන පනත මගින් පිහිටුවන ලද ශ්‍රී ලංකා ඉංජිනේරු ආයතනය විසින් පිළිබත් වසර හතරක පූර්ණ කාලීන ඉංජිනේරු උපාධිය හෝ 1968 අංක 17 ඉංජිනේරු ආයතන පනත මගින් පිහිටුවන කරන ලද ශ්‍රී ලංකා ඉංජිනේරු ආයතනයේ ආශ්‍රිත සාමාජිකයෙකු වීම.

අනුබද්ධ ඉංජිනේරු

1968 අංක 17 දරණ ශ්‍රී ලංකා ඉංජිනේරු ආයතන පනත මගින් පිහිටුවන ලද ශ්‍රී ලංකා ඉංජිනේරු ආයතනය විසින් පිළිගත් වසර තුනක පූර්ණ කාලීන ඉංජිනේරු උපාධිය ලබා තිබීම.

සංස්ථාගත ඉංජිනේරු

1992 අංක 64 දරණ ශ්‍රී ලංකා සංස්ථාගත ඉංජිනේරුවරුන්ගේ ආයතනය (සංස්ථාගත කිරීමේ) පනත මගින් පිහිටුවන ලද ශ්‍රී ලංකා සංස්ථාගත ඉංජිනේරු ආයතනයේ සංස්ථාපිත ඉංජිනේරුවරයෙකු වීම.

ඉංජිනේරු ඩිප්ලෝමාධාරී

1992 අංක 64 දරණ ශ්‍රී ලංකා සංස්ථාගත ඉංජිනේරුවරුන්ගේ ආයතනය (සංස්ථාගත කිරීමේ) පනත මගින් පිළිගත්, පිළිගත් විශ්වවිද්‍යාලයකින් හෝ තාක්ෂණ විද්‍යා ආයතනයෙන් ඉංජිනේරු ඩිප්ලෝමාවක් ලබා තිබීම.

ඉංජිනේරු කාර්මික

(i) 1990 අංක 20 දරණ තෘතීය සහ වෘත්තීය අධ්‍යාපන පනත මගින් පිහිටුවන ලද තෘතීයික අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගත් තාක්ෂණ ඉංජිනේරු iv වන මට්ටම ජාතික වෘත්තීය සුදුසුකම (NVQ Level 4) හෝ සමාන සුදුසුකමක් ලබා තිබීම.

(ii) ඉංජිනේරු තාක්ෂණ විද්‍යාව පිළිබඳ වසර එකක පූර්ණ කාලීන අධ්‍යයන පාඨමාලාවක් හදාරා තිබීම සහ අදාල ක්ෂේත්‍රයේ වසර එකක කාර්මික පලපුරුද්දක් ලබා තිබීම හෝ ශ්‍රී ලංකා රජයේ විශ්වවිද්‍යාලයකින් හෝ තාක්ෂණික හෝ තාක්ෂණ විද්‍යා ආයතනයකින් තාක්ෂණ විද්‍යාව පිළිබඳව ඩිප්ලෝමාවක් හෝ සහතිකයක් දරන්නෙකු වීම.

# සභාපතිතුමාගේ පණිවිඩය



තිලක් ද සිල්වා මහතා

*BSc Eng., MSc, CEng (SL), CEng (UK), CITP (UK), FIE (SL), FIET (UK), FBCS (UK), SMIEEE (USA),MCS (SL)*

ශ්‍රී ලංකා ඉංජිනේරු සභාවේ සභාපතිවරයා වශයෙන් 2021 වර්ෂය සඳහා වූ වාර්ෂිකව වාර්තාව ඉදිරිපත් කරනු ලබන්නේ ඉතාම සතුටිනි. ගතවූ වසර අවිනිශ්චිතභාවයෙන් පිරි අභියෝගාත්මකව වර්ෂයක් වුවද ඒ සියල්ල මධ්‍යයේ අපගේ මෙහෙවර අඛණ්ඩව ඉදිරියට ගෙන යෑමට අවශ්‍ය සියලු පියවර ගත්තෙමු.

වසරේ වැඩි කාලයක් COVID-19 වසංගතය නිසා රට සම්පූර්ණයෙන් වසා තිබුණු කාලයේ වුව ද සෞඛ්‍ය ආරක්ෂක මාර්ගෝපදේශ වලට අනුකූලව මාසික රැස්වීම් නොකඩවා සෑම මසකම පවත්වන ලදී. සම්පූර්ණ මාසික රැස්වීම් දොළහක් පවත්වන ලද අතර ඉන් හරි අඩක් පැවැත්වූයේ මාර්ගගත ක්‍රමයට වේ. එය අපගේ තීරණ ගැනීම සඳහා කිසිම බාධාවක් නොවන පරිදි ඉතාමත් කාර්යක්ෂම ලෙසින් පවත්වන ලදී.

අපගේ මූල්‍ය කටයුතු නිසියාකාරව සිදු කිරීම සඳහා ඩිජිටල් බැංකුකරණ යාන්ත්‍රණයක් ආරම්භ කරන ලද අතර ඊට අමතරව සේවක අර්ථසාධක අරමුදල්, සේවක භාරකාර අරමුදල් ගෙවීම නිසි වේලාවට මාර්ගගත ක්‍රමය ඔස්සේ සිදු කිරීමට ද සේවක වැටුප් හා දීමනා ඩිජිටල් බැංකුකරණය හරහා නිසි වේලාවට ලබාදීම සිදුකිරීම ද පැවැති තත්ත්ව යටතේ විශිෂ්ඨ ජයග්‍රහණයක් ලෙස සැලකිය හැකිය.

දීර්ඝ කාලයක් තිස්සේ ලියාපදිංචි කිරීම ආරම්භ කිරීමට උත්සාහ කළ මුත් කළ නොහැකිව තිබූ ඉංජිනේරු කාර්මිකයන් ලියාපදිංචි කිරීම ආරම්භ කිරීම අපගේ ලියාපදිංචි කිරීමේ ක්‍රියාවලියේ සැලකිය යුතු සංධිස්ථානයකි. මීට අමතරව සුදුසුකම් ලත් ඉංජිනේරු කාර්මිකයන්ගේ විස්තර අපගේ වෙබ් අඩවියේ පළකිරීමෙන් මහජනතාවට ඉතා හොඳ ඉංජිනේරු කාර්මිකයින්ගේ සේවය ලබාගැනීම සඳහා ඔවුන් සොයා ගැනීමට පහසුකම් සැලසීමෙන් මහජන සේවාවක් ද සිදු කර ඇත.

තවද ඉංජිනේරු වෘත්තිකයන් ලියාපදිංචි වීමේ වැදගත්කම අවධාරණය කරමින් මහජනතාව දැනුවත් කිරීමේ ගුවන්විදුලි වැඩසටහන් සහ භාෂා තුනෙන්ම පුවත්පත් නිවේදන නිකුත් කිරීම සිදු කරන ලදී.

ඉතාමත් කාර්යක්යක්ෂම, අඛණ්ඩ සහ කඩිනම් සේවා සැපයීමේ අවශ්‍යතාව තෘප්ත කිරීම සඳහා තොරතුරු තාක්ෂණය උපරිම ලෙස යොදා ගන්නා ලද අතර මෙය අනෙකුත් ආයතනවලටද ප්‍රායෝගිකව තොරතුරු තාක්ෂණය පාවිච්චි කිරීම පිළිබඳව ඉතා හොඳ අදහසක් ලබාගත හැකි අවස්ථාවක් විය.

අපගේ පළමු වන වාර්ෂික වාර්තාව වන 2019 සමාරම්භක වාර්ෂිකව වාර්තාව රජයේ ක්‍රමවේදය අධ්‍යයනය කර එහි වැඩ කටයුතු අවසන් කර පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීමට හැකි වීම වැදගත් ජයග්‍රහණයක් ලෙස සැලකිය හැකිය. තවද ඉංජිනේරුවරුන්ගේ සභාවේ නිල වෙබ් අඩවිය පූර්ණ රජයේ ආයතනයක ස්වරූපයට අනුව gov.lk ආකාරයට පරිවර්තනය කර www.ecsl.gov.lk ලෙස එළිදක්වන ලදී.

2020 වර්ෂයේදී 15,758 වූ ලියාපදිංචි ඉංජිනේරු වෘත්තියන් ගණන 2021 වර්ෂයේදී 17,485 දක්වා ඉහළ යාම සතුටට කාරණයකි. මෙම වර්ධනය ශ්‍රී ලංකාවේ ඉංජිනේරු වෘත්තිකයන්ගේ ඉහළම ප්‍රමිතීන් ආරක්ෂා කිරීම සඳහා අපගේ ස්ථිර කැපවීම නැවත තහවුරු කරයි. අපි සියලු ලියාපදිංචි ඉංජිනේරු වෘත්තිකයන්ට සහතික නිකුත් කිරීම දිගටම කරගෙන ගියෙමු, එහි සත්‍යතාවය අපගේ වෙබ් අඩවියට පිවිසීමෙන් තහවුරු කළ හැකි ක්‍රමවේදයක් සකස් කර ඇත.


අනාගතය දෙස අපගේ අවධානය යොමු කරන විට, අපගේ සේවාවන් සහ මෙහෙයුම් තවදුරටත් වැඩි දියුණු කිරීම සඳහා අපගේ අධිෂ්ඨානය නොසැලෙන ලෙස පවතී. අපගේ කාර්යක්ෂමතාව ඉහළ නැංවීම සඳහා තාක්ෂණය උපයෝගී කර ගැනීම, විනිවිදභාවය සහ වගවීම ඉහළම මට්ටමක පවත්වා ගැනීම

සහ ශ්‍රී ලංකාව තුළ වෘත්තීය ඉංජිනේරු ප්‍රමිතීන් වෙනුවෙන් පෙනී සිටීම කෙරෙහි අපගේ අවධානය නොවෙනස්ව පවතී.

අවසාන වශයෙන්, අපගේ සියලු පාර්ශවකරුවන්ට ඔවුන්ගේ නොසැලෙන සහයෝගය සහ අප කෙරෙහි විශ්වාසය තැබීම ගැන මම මගේ ස්තූතිය පුද කරමි. අපගේ කැපවීම සහ නොපසුබට උත්සාහය ඉතා අභියෝගාත්මක කාලවලදී පවා අපගේ අරමුණු සපුරා ගැනීමට අපව සවිබල ගැන්වූ අපගේ කණ්ඩායමට මම කෘතඥතාව පළ කිරීමට කැමැත්තෙමි.

***

## සංවිධාන ව්‍යුහය



## සභාව

සභාව සාමාජිකයන් 17 දෙනෙකුගෙන් සමන්විත වන අතර ඉන් 04 දෙනෙකු නිල වශයෙන් (මහාචාර්ය ධූරයට පහල ධූරයන් නොවන ඉංජිනේරු පීඨවල පීඨාධිපතිවරුන් තිදෙනෙකු සහ තෘතීය සහ වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාවේ අධ්‍යක්ෂ ජනරාල්) පත්වන සාමාජිකයන් වන අතර අනෙකුත් සාමාජිකයන් 13 දෙනා ශ්‍රී ලංකා ඉංජිනේරු සභාවට අදාල රේඛීය අමාත්‍යාංශය භාර අමාත්‍යවරයා විසින් පත් කරනු ලැබේ.

"පත්කරනු ලබන සාමාජිකයන්" සෑම දෙවසරකට වරක් ශ්‍රී ලංකා ඉංජිනේරු ආයතනය විසින් නම් කරනු ලබන්නා වූ විවිධ ඉංජිනේරු ක්ෂේත්‍රයන් නියෝජනය කරනු ලබන වරළත් ඉංජිනේරුවන් හත් දෙනෙකුගෙන් ද ශ්‍රී ලංකා සංස්ථාගත ඉංජිනේරු ආයතනය විසින් සෑම දෙවසරකට වරක් නම් කරනු ලබන විවිධ ඉංජිනෙරු ක්ෂේත්‍රයන් නියෝජනය කරන ලබන සාමාජිකයන් 04 දෙනෙකුගෙන් ද ශ්‍රී ලංකා ඉංජිනේරු සේවය විසින් නම් කරනු ලබන වරළත් ඉංජිනේරු වරයෙකුගෙන් සහ තෘතීය හ වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් නම් කරනු ලබන ඉංජිනේරු කාර්මිකයන්ගේ නියෝජිතයෙකු ගෙන් ද සමන්විත වේ.

අමාත්‍යවරයා විසින් පත් කරනු ලබන සාමාජිකයන් අතරින් වරලත් ඉංජිනේරුවරුන්ගෙන් කෙනෙකු ශ්‍රී ලංකා ඉංජිනේරු සභාවේ සභාපතිවරයා ලෙස පත් කරනු ලබයි. 2018 වර්ෂයේ අප්‍රේල් මස පත්කරනු ලැබූ සභවේ සාමාජිකයන් පහත පරිදි වේ.

සභාවේ සාමාජිකයින්

තිලක් ද සිල්වා මහතා, සභාපති
*BSc Eng., MSc, CEng(SL), CEng(UK), CITP(UK), FIE(SL), FIET(UK), FBCS(UK), SMIEEE(USA),MCS(SL)*

මහාචාර්ය එන්.කේ. වික්‍රමාරච්චි, සාමාජික (නිල බලයෙන්)
*BSc Eng., MSc, PhD, DIC, CEng, MIE(SL)*

මහාචාර්ය පී.බී.බී. හේරත්, සාමාජික (නිල බලයෙන්)
*BSc Eng., MEng, PhD*

මහාචාර්ය ඒ. අත්පුතරාජා, සාමාජික (නිල බලයෙන්) (2021 ජූනි 26 දක්වා)
*BSc Eng.(Hons), PhD, CEng, MIE(SL)*

බී.කේ.යූ.ඒ. වික්‍රමසිංහ, සාමාජික(නිල බලයෙන්) (2021 ජූලි 12 සිට)
*BSc Eng, M.Ed (Manchester), MSc (Moratuwa), MIE (SL), CEng, MITD (UK)*

ආචාර්ය කේ.පිරපාහරන්, සාමාජික (නිල බලයෙන්) (2021 නොවැම්බර් 26 සිට)
*BSc.Eng, MEng, DEng, CEng, MIEEE, MIET*

ආචාර්ය ආනන්ද රණසිංහ, සාමාජික (2021 ජූලි 1 සිට)
BSc, MTech, MEng, LLM (Colombo) LLM (Wales), PhD, CEng, FIStructE (UK), FICE (UK), FIE (SL), FSSE, FCIArb, Attorney at Law

ජේ. මීගොඩ මහතා, සාමාජික
*BSc Eng.(Hons), PGD, MBA, CEng, FIE(SL), Int PE(SL), MIEEE(USA)*

කේ.පී.අයි.යූ. ධර්මපාල මහතා, සාමාජික
*BSc Eng, CEng, FIE(SL), FICE(UK), FIE(Aust.), MASCE(USA), MSSE(SL), MACE(SL),IntPE(SL), PEng(Aust)*

ඒ. මනම්පේරි මහතා, සාමාජික
*BSc Eng, MS Eng, MBA, CEng, FIE(SL)*

ජේ.ඒ.පී.ආර්. ජයලත් මහතා, සාමාජික
*BSc Eng., MSc Eng. , MEcon, PG(Dip)IT, PG(Dip) Const Mgt. FIE(SL), FCIHT(UK), LM(IRC), CMILT, MSSE(SL)*

කෝසල කඹුරාදෙණිය මහතා, සාමාජික
BSc Eng, PG Dip(Ind. Eng), MBA, Dip(Com. Arb), Attorney-at-Law, CEng, FIE(SL), IntPE(SL), MIET, MIEEE

ආචාර්ය ටී.ඒ.පී. ගුණසේකර, සාමාජික
*M Eng, MSc Eng (Hons), PhD, CEng, IEng, MIE(SL), FIIE(SL)*

ඩී.එස් සෙනරත් මහතා, සාමාජික
*MCGI(UK), IEng ,MEG(SL), DTM(USA), FIIE(SL)*

කේ. ආරියවංශ මහතා, සාමාජික
*GCGI(UK), MCGI(UK), IEng, MASCE(USA), MEG(SL), FIIE(SL)*

යූ.පී.පී. කවිකේශව මහතා, සාමාජික (2021 පෙබරවාරි 12 දක්වා)
*BSc (Hons), MCGI (UK), IEng, TEng. AIE(SL), MEG(SL), MIAENG, FIIE(SL)*

පී.ඒ.ඩී.ආර්. චන්ද්‍රසිරි මහතා, සාමාජික (2021 ඔක්තෝම්බර් 18 සිට)
*GCGI(UK), FIIESL, Ieng*

ඩී. අබේසිරිවර්ධන මහතා, සාමාජික
*BSc Eng, CEng, MIE(SL)*

එස්.යූ.කේ. රූබසිංහ මහතා, සාමාජික
*PGDBM, PGCTM, AMIE(SL)*

## කාර්ය මණ්ඩලය

| | | සංඛ්‍යාව |
|---|---|---|
| 1. | ප්‍රධාන විධායක නිලධාරී | 01 |
| 2. | ලේඛකාධිකාරී | 01 |
| 3. | ප්‍රධාන තොරතුරු තාක්ෂණ නිලධාරී | 01 |
| 4. | ගණකාධිකාරී (අර්ධ කාලීන) | 01 |
| 5. | තොරතුරු තාක්ෂණ සහකාර | 01 |
| 6. | කලමනාකරණ සහකාර | 01 |
| 7. | පෞද්ගලික සහකාර | 01 |
| 8. | කාර්යාල සහායක | 01 |

## සභාවේ රැස්වීම් වාර

| | |
|---|---|
| 15 ජනවාරි 2021 | 08 ජූලි 2021 |
| 11 පෙබරවාරි 2021 | 12 අගෝස්තු 2021 |
| 12 මාර්තු 2021 | 09 සැප්තැම්බර් 2021 |
| 08 අප්‍රියෙල් 2021 | 14 ඔක්තෝබර් 2021 |
| 12 මැයි 2021 | 11 නොවැම්බර් 2021 |
| 10 ජූනි 2021 | 09 දෙසැම්බර් 2021 |

# සම්පූර්ණ කර ඇති සහ සිදු කරමින් පවතින ක්‍රියාකාරකම්

සම්පූර්ණ කර ඇති ක්‍රියාකාරකම්

1) ඉංජිනේරු වෘත්තිකයන් ලියාපදිංචි කිරීම
2021 සඳහා ලියාපදිංචි වෘත්තිකයන් ගණන.

| | | |
|---|---|---|
| ➢ වරලත් ඉංජිනේරු | - | 5,140 |
| ➢ සහකාර ඉංජිනේරු | - | 10,915 |
| ➢ අනුබද්ධ ඉංජිනේරු | - | 117 |
| ➢ සංස්ථාපිත ඉංජිනේරු | - | 464 |
| ➢ ඉංජිනේරු ඩිප්ලෝමාධාරීන් | - | 792 |
| ➢ ඉංජිනේරු කාර්මික | - | 57 |
| එකතුව | | -17,485 |

2) 2021 ජනවාරි 01 සිට 2021 දෙසැම්බර් 31 දක්වා කාලය තුළ සභා රැස්වීම් 12 ක් පවත්වා ඇත. COVID-19 වසංගතය හේතුවෙන් නිකුත් කරන ලද සෞඛ්‍ය මාර්ගෝපදේශවලට අනුකූලව රැස්වීම් දොළහෙන් හයක් මාර්ගගතව පවත්වන ලදී.

3) ප්‍රමාදයන් අවම කිරීම සඳහා වැටුප්, දීමනා, EPF, ETF සහ අනෙකුත් ගෙවීම් සඳහා හැකිතාක් දුරට බැංකු මාර්ගගත ගනුදෙනු ආරම්භ කරන ලදී.

4) ලියාපදිංචි කිරීමේ ක්‍රියාපාටිය අවසන් කර ඉංජිනේරු කාර්මිකයින් ලියාපදිංචි කිරීම ආරම්භ කරන ලදී.

5) 2012 දෙසැම්බර් 14 දින හා PED 55 අංක දරන පොදු ව්‍යවසාය චක්‍රලේඛයට අනුව සභාව සඳහා විගණන කමිටුව ස්ථාපිත කර ක්‍රියාත්මක වීම ආරම්භ කර ඇත.

6) සභාවේ මූල්‍ය ප්‍රකාශන රාජ්‍ය සේවා ගිණුම්කරණ ප්‍රමිතීන්ට (PSAS) අනුකූලව සකස් කර ඇත.

7) සභා රැස්වීම පැවැත්වීම සඳහා ක්‍රියා පටිපාටියක් සම්මත කරන ලදී.

8) සභාවේ පළමු වාර්ෂික වාර්තාව (2019 වසර සඳහා) සම්පූර්ණ කර ඇත. එය පාර්ලිමේන්තුවට ඉදිරිපත් කර වාර්තාව ප්‍රකාශයට පත් කිරීමට කටයුතු කරමින් පවතී.

9) කාර්යාල කටයුතු සඳහා හැකිතාක් තොරතුරු තාක්‍ෂණ තාක්‍ෂණය යෙදීමේ ප්‍රතිඵලයක් ලෙස සභාවට වසංගත කාලය තුළ සිය වගකීම් ප්‍රමාදයකින් තොරව ඉටු කිරීමට හැකි විය.

10) පසු විපරම් පියවරක් ලෙස, පෙර වසරේ ලියාපදිංචි වූ නමුත් 2021 වර්ෂය සඳහා නියමිත දිනයට ලියාපදිංචි වීමට අපොහොසත් වූ සියලුම ඉංජිනේරු වෘත්තිකයන් වෙත සිහි කැඳවීම් යවන ලදී.

11) ශ්‍රී ලංකා ඉංජිනේරු ආයතනයේ ලියාපදිංචි කිරීමේ ක්‍රියාවලිය තවදුරටත් විධිමත් කිරීමට කටයුතු කරන ලදී.

12) වරලත් ඉංජිනේරුවන් ලියාපදිංචි කිරීමේ වැදගත්කම සහ සැබෑ ඉංජිනේරු වෘත්තිකයන් හඳුනා ගැනීමේදී ජනතාවට සහ සංවිධානවලට එය ප්‍රයෝජනවත් වන්නේ කෙසේද යන්න පිළිබඳව ජනතාව දැනුවත් කිරීම සඳහා භාෂා තුනෙන්ම පුවත්පත්වල දැන්වීම් පළ කිරීම.

13) ශ්‍රී ලංකා ඉංජිනේරු සභාව පනතේ විධිවිධාන ක්‍රියාත්මක කිරීමේ පියවරක් ලෙස ඉංජිනේරු වෘත්තිකයන් බඳවා ගැනීම් සහ උසස් කිරීමේ දී සභාවේ ලියාපදිංචිය සලකා බලන ලෙස සියලුම ඉංජිනේරු සංවිධානවලට චක්‍රලේඛයක් නිකුත් කරන ලදී.

14) ඉංජිනේරු සභාව සඳහා www.ecsl.gov.lk වෙබ් අඩවිය හඳුන්වා දෙන ලදී.

15) පහත සඳහන් පාඨමාලාවල තොරතුරු රැස් කිරීම ආරම්භ කරන ලදී:

a. ශ්‍රී ලංකාවේ පැවැත්වෙන ඉංජිනේරු උපාධි පාඨමාලා
b. ශ්‍රී ලංකාවේ පැවැත්වෙන ඉංජිනේරු ඩිප්ලෝමා පාඨමාලා
c. ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මක වන ඉංජිනේරු ක්ෂේත්‍ර

16) පහත සඳහන් කරුණු පිළිබඳ සාකච්ඡා සිදු වෙමින් පවතී.

a. භූමිකාවන්, වගකීම් සහ නිපුණතා
b. විනය ක්‍රියාවලිය
c. විදේශීය ඉංජිනේරු වෘත්තිකයන් ලියාපදිංචි කිරීම
d. "තාක්ෂණවේදීන්" කාර්මික ක්ෂේත්‍රයේ ස්ථානගත කිරීම.
e. සේවකයින් සඳහා දීමනා සහ සුබසාධන ප්‍රතිලාභ.

17) ලියාපදිංචි වී ඇති සියලුම ඉංජිනේරු වෘත්තිකයන් සඳහා අඛණ්ඩව ඉලෙක්ට්‍රොනික සහතිකපත් නිකුත් කිරීම. සහතිකයේ සත්‍යතාව තහවුරු කිරීම සඳහා www.ecsl.gov.lk වෙබ් අඩවියේ පහසුකම් සැලසීම.

සිදු කරමින් පවතින ක්‍රියාකාරකම්

1) නීති සහ රෙගුලාසි තවදුරටත් සකස් කිරීම.
2) විදේශීය ඉංජිනේරු වෘත්තිකයන් ලියාපදිංචි කිරීම සඳහා ක්‍රියාවලියක් සකස් කිරීම

# මූල්‍ය ප්‍රකාශනය

මූල්‍ය ප්‍රකාශනය

මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශය

| 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වසර සඳහා | සටහන අංක | 2021 රු. '000 | 2020 රු. '000 | 2019 රු. '000 |
|---|---|---|---|---|
| මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් ලැබෙන ආදායම | 01 | 18,127 | 15,757 | 17,033 |
| භාණ්ඩාගාර ප්‍රධාන - පුනරාවර්තන | | 3,495 | 800 | 3,548 |
| පොලී ආදායම | 02 | 1,260 | 1,008 | |
| මුළු ආදායම | | 22,882 | 17,565 | 20,581 |
| පරිපාලන වියදම් | 3.1 | (8,611) | (5,938) | (2,805) |
| ගිවිසුම්ගත සේවා සහ නඩත්තු වියදම් | 3.2 | (746) | (659) | (454) |
| අනෙකුත් මෙහෙයුම් වියදම් | 3.3 | (1,137) | (633) | (2,625) |
| ක්ෂය වීම | | (182) | (52) | |
| මුළු වියදම් | | (10,676) | (7,282) | (5,884) |
| මෙහෙයුම් වලින් අතිරික්තය / (ඌනතාව) | | 12,206 | 10,283 | 14,697 |
| බදු | | (1,656) | (1,329) | (1,086) |
| කාල පරිච්ඡේදය සඳහා අතිරික්තය / (ඌනතාව) | | 10,550 | 8,954 | 13,611 |

මූල්‍ය තත්ව ප්‍රකාශනය
2021 දෙසැම්බර් 31 දිනට

| | සටහන අංක | 2021 රු. '000 | 2020 රු. '000 | 2019 රු. '000 |
|---|---|---|---|---|
| වත්කම් | | | | |
| ජංගම වත්කම් | | | | |
| මුදල් සහ මුදල් සමාන දෑ | 04 | 2,310 | 2,235 | 2,038 |
| මුදල් සහ මුදල් සමාන දෑ - කෙටි කාලීන ආයෝජන | 05 | 30,926 | 20,008 | 14,000 |
| වෙළඳ සහ අනෙකුත් ලැබීම් | 06 | 567 | 1,194 | 3,731 |
| පූර්ව ගෙවීම් | 07 | 81 | 23 | 30 |
| | | 33,883 | 23,460 | 19,799 |
| ජංගම නොවන වත්කම් | | | | |
| දේපල,යන්ත්‍රෝපකරණ සහ උපකරණ | 08 | 2,541 | 3036 | 2,541 |
| මුළු වත්කම් | | 36,424 | 26,496 | 22,340 |
| වගකීම් | | | | |
| ජංගම වගකීම් | | | | |
| අනෙකුත් ප්‍රතිපාදන සහ ගෙවිය යුතු දෑ | 09 | 1,528 | 1,523 | 6,188 |
| ජංගම නොවන වගකීම් | | | | |
| විලම්බිත ආදායම (රජයේ දීමනා සඳහා) | 10 | 1,779 | 2,408 | 3,036 |
| මුළු වගකීම් | | 3,307 | 3,931 | 9,224 |
| ශුද්ධ වත්කම් | | 33,117 | 22,565 | 13,116 |
| ශුද්ධ වත්කම් / හිමිකම් ප්‍රාග්ධනය හා සංචිත | | | | |
| දායක ප්‍රාග්ධනය | 11 | | | - |
| සමුච්චිත ලාභය/(ඌනතාව) | 12 | 33,117 | 22,565 | 13,611 |
| මුළු ශුද්ධ වත්කම් / හිමිකම් | | 33,117 | 22,565 | 13,611 |

05 සිට 13 දක්වා පිටුවල සඳහන් ගිණුම්කරන ප්‍රතිපත්ති සහ සටහන් මෙම මූල්‍ය ප්‍රකාශනවල අන්තර්ගත කොටසක් වේ.
ඉංජිනේරු සභාවේ දැනට ඇති වාර්තාවලට අනුව ඉහත සඳහන් මූල්‍ය ප්‍රකාශන සත්‍ය සහ නිවැරදි බවට සහතික කරමි.

අත්සන් කළේ පී .ඒ.පී . සිල්වා
ගණකාධිකාරී (වැඩබලන)
මූල්‍ය ප්‍රකාශන සකස් කිරීම හා ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් සභාවේ සාමාජිකයන් වගකිම දරනු ලබයි.
ඉංජිනේරු සභාව වෙනුවෙන් අනුමත කර අත්සන් තබන ලදී.

අත්සන් කළේ ඉංජිනේරු තිලක් ද සිල්වා
සභාපති
ශ්‍රී ලංකා ඉංජිනේරු සභාව
2022 පෙබරවාරි 10

අත්සන් කළේ ඉංජිනේරු ඩී .එස් . සෙනරත්
සභාවේ සාමාජික

ශුද්ධ වත්කම් / කොටස්වල වෙනස්කම් පිළිබඳ ප්‍රකාශය
2021 දෙසැම්බර් 31 දිනට

සටහන: 12

| | දායක විය ප්‍රාග්ධනය රුපියල් 000 | සමුච්චිතයි ලාභය/හිගය රුපියල් 000 | සම්පූර්ණ රුපියල් 000 |
|---|---|---|---|
| 2018 දෙසැම්බර් 31 වැනි දිනට ගෙනෙන ලද ශේෂය | - | - | - |
| කාල සීමාව සඳහා අතිරික්තය / (ඌනතාවය) | | 13,611 | 13,611 |
| 2019 දෙසැම්බර් 31 දිනට ශේෂය | - | 13,611 | 13,611 |
| 2019 දෙසැම්බර් 31 වැනි දිනට ගෙනෙන ලද ශේෂය | | 13,611 | 13,611 |
| කාල සීමාව සඳහා අතිරික්තය /(ඌනතාවය) | | 8,954 | 8,954 |
| 2020 දෙසැම්බර් 31 දිනට ශේෂය | - | 22,565 | 22,565 |
| 2020 දෙසැම්බර් 31 දිනට ශේෂය ගෙනෙන ලද ශේෂය | | 22,565 | 22,565 |
| කාල සීමාව සඳහා අතිරික්තය /(ඌනතාවය) | | 10,552 | 10,552 |
| 2021 දෙසැම්බර් 31 දිනට ශේෂය | - | 33,117 | 33,117 |

මුදල් ප්‍රවාහ ප්‍රකාශනය

| | 2021<br>රු. '000 | | 2020<br>රු. '000 | | 2019<br>රු. '000 | |
|---|---|---|---|---|---|---|
| මෙහෙයුම් කටයුතු වලින් ලද මුදල් ප්‍රවාහ | | | | | | |
| භාණ්ඩාගාර ප්‍රදාන (පුනරාවර්තන) වලට පෙර අතිරික්තය/(ඌනතාවය) | 7,055 | | 8,154 | | 11,149 | |
| එකතු කළ : ලැබුණු භාණ්ඩාගාර ප්‍රදාන (පුනරාවර්තන) | 3,495 | | 800 | | 3,548 | |
| එකතු කළ: ක්ෂය වීම | 182 | | 52 | | - | |
| වර්ෂයේ බදු අඩු කිරීමට පෙර අතිරික්ත / (ඌනතාවය ) | 10,732 | | 9,006 | | 14,697 | |
| මුදල් නොවන සංචලන | | | | | | |
| ගෙවිය යුතු දෑ වැඩි වීම | 5 | | (4665) | | 5,102 | |
| අනෙකුත් ජංගම වත්කම් පහල යාම | 571 | 576 | 2,545 | (2,120) | (3,761) | 1,341 |
| මෙහෙයුම් කටයුතු වලින් ශුද්ධ මුදල් ප්‍රවාහය | | 11,308 | | 6,886 | | 16,038 |
| ආයෝජන කටයුතු වලින් ලද මුදල් ප්‍රවාහය | | | | | | |
| දේපල යන්ත්‍රෝපකරණ හා උපකරණ මිලදී ගැනීම් | (315) | | (681) | | (3,140) | |
| ආයෝජන කටයුතු වලින් ලද ශුද්ධ මුදල් ප්‍රවාහය | | (315) | | (681) | | (3,140) |
| මූල්‍ය කටයුතු වලින් ලද මුදල් ප්‍රවාහය | | | | | | |
| රජයේ ප්‍රදාන (දේපල යන්ත්‍රෝපකරණ හා උපකරණ සඳහා ප්‍රාග්ධනය) | - | | - | | 3,140 | |
| මූල්‍ය ක්‍රියාකාරකම් වලින් ලද ශුද්ධ මුදල් ප්‍රවාහය | | - | | - | | 3,140 |
| මුදල් හා මුදල් සමාන දෑ ශුද්ධ වැඩිවීම/(අඩුවීම) | | 10,993 | | 6,205 | | 16,038 |
| කාලපරිච්ඡේදය ආරම්භයේ දී මුදල් හා මුදල් සමාන දෑ | | 22,243 | | 16,038 | | - |
| කාලපරිච්ඡේදය අවසානයේ දී මුදල් සහ මුදල් සමාන දෑ | | 33,236 | | 22,243 | | 16,038 |

මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සඳහා සටහන්

මුදල් හා මුදල් සමාන දෑ බැංකු ශේෂයන්ගෙන් සමන්විත වේ. මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ ඇතුලත් මුදල් හා මුදල් සමාන දෑ පහත සඳහන් මූල්‍ය තත්ව ප්‍රකාශන වලින් සමන්විත වේ.

| | 2021<br>රු. '000 | 2020<br>රු. '000 | 2019<br>රු. '000 |
|---|---|---|---|
| බැංකුවේ ජංගම ගිණුමේ ශේෂය (සටහන අංක 04 ) | 2,310 | 2,235 | 2038 |
| ආයෝජන- ස්ථාවර තැන්පතු (කෙටි කාලීන) (සටහන අංක 05) | 30,926 | 20,008 | 14,000 |
| | 33,236 | 22,243 | 16,038 |

මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්

මෙහෙයුම් කටයුතු වලින් ලද ආදායම්

| | | 2021 | 2020 | 2019 |
|---|---|---|---|---|
| සටහන අංක:01<br>ලියාපදිංචි කිරීම | | රු. '000 | රු. '000 | රු. '000 |
| 2021 වර්ෂයේ ලියාපදිංචි කිරීම් | සාමාජිකයින් සංඛ්‍යාව | | | |
| වරළත් ඉංජිනේරුවන් | 5,140 | 5,140 | 4906 | 5,409 |
| ආශ්‍රිත ඉංජිනේරුවන් | 10,915 | 10,915 | 9716 | 10,491 |
| අනුබද්ධ ඉංජිනේරුවන් | 117 | 117 | 91 | 129 |
| සංස්ථාගත ඉංජිනේරුවන් | 464 | 464 | 446 | 410 |
| ඉංජිනේරු ඩිප්ලෝමාධාරීන් | 792 | 792 | 598 | 594 |
| ඉංජිනේරු තාක්ෂණවේදීන් | 57 | 57 | | |
| උප එකතුව -ලියාපදිංචිය 2021 | 17,485 | 17,485 | 15,757 | 17,033 |
| ලියාපදිංචිය - හිඟ මුදල් | | | | |
| වරළත් ඉංජිනේරුවන් | | 147 | | |
| ආශ්‍රිත ඉංජිනේරුවන් | | 459 | | |
| අනුබද්ධ ඉංජිනේරුවන් | | 5 | | |
| සංස්ථාගත ඉංජිනේරුවන් | | 11 | | |
| ඉංජිනේරු ඩිප්ලෝමාධාරීන් | | 20 | | |
| උප එකතුව - ලියාපදිංචිය - හිඟ මුදල් | | 642 | | |
| මුළු එකතුව | | 18,127 | 15,757 | 17,033 |

| | 2021 | 2020 |
|---|---|---|
| සටහන අංක: 02 | | |
| පොලී ආදායම | | |
| පොලී ආදායම: ගිණුම් අංක 85326186 | 180 | 224 |
| පොලී ආදායම: ගිණුම් අංක 86301038 | 250 | 63 |
| පොලී ආදායම: ගිණුම් අංක 85326167 | 511 | 721 |
| පොලී ආදායම: ගිණුම් අංක 87555504 | 297 | |
| පොලී ආදායම: ඉතුරුම් ගිණුම | 22 | |
| මුළු එකතුව | 1,260 | 1,008 |

වියදම්

| | | | |
|---|---|---|---|
| සටහන අංක: 3.1 | | | |
| පරිපාලන පිරිවැය | | | |
| වැටුප් සහ වේතන | 5,302 | 2466 | 918 |
| සභාවේ සාමාජිකයන්ගේ දීමනා | 3,309 | 3472 | 1,887 |
| එකතුව | 8,611 | 5938 | 2,805 |
| සටහන අංක: 3.2 | | | |
| ගිවිසුම් ගත සේවා සහ නඩත්තු වියදම් | | | |
| තැපැල් හා දුරකථන ගාස්තු | 335 | 289 | 18 |
| තොරතුරු තාක්ෂණ වියදම් | 136 | 114 | 165 |
| සංග්‍රහ | 108 | 92 | 68 |
| විගණන ගාස්තු | | 75 | 75 |
| මුද්‍රණ | 168 | 10 | 34 |
| උපදේශන ගාස්තු | | 52 | 49 |
| විවිධ වියදම් | | | 33 |
| කාර්යාල උපකරණ නඩත්තු කිරීම | | 27 | 12 |
| එකතුව | 746 | 659 | 454 |
| | | | |
| සටහන අංක: 3.3 | | | |
| වෙනත් මෙහෙයුම් වියදම් | | | |
| ලිපි ද්‍රව්‍ය හා කාර්යාල අවශ්‍යතා | 172 | 30 | 3 |
| වාර සඟරා සහ පුවත්පත් | 224 | 286 | 600 |
| බැංකු ගාස්තු | 18 | 13 | 3 |
| වෙනත් මෙහෙයුම් වියදම් | 89 | 88 | 2,016 |
| වෙළඳ දැන්වීම් වියදම් | 197 | | |
| දැනුවත් කිරීමේ වැඩසටහන | 108 | | |
| ගමන් සහ ප්‍රවාහන | 49 | 22 | |
| ජලය | 13 | 24 | |
| වෙබ් දියුණු කිරීම | 27 | 170 | |
| නීති ගාස්තු | 210 | | |
| ලියාපදිංචි ගාස්තු ප්‍රතිපූරණය | 24 | | |
| පරිවර්තන වියදම් | 4 | | |
| එකතුව | 1,137 | 633 | 2,625 |
| ක්ෂය වීම | 182 | 52 | |
| මුලු එකතුව | 10,676 | 7,282 | 5,884 |

| | 2021 | 2020 | 2019 |
|---|---|---|---|
| | රු. '000 | රු. '000 | රු. '000 |
| සටහන අංක:04 | | | |
| මුදල් සහ මුදල් සමානයන් | | | |
| (1) ලංකා බැංකුව (නිදහස් චතුරස්‍රය) (ජංගම ගිණුම් අංක 83585687) | 146 | (1,871) | 1,570 |
| (2) ලංකා බැංකුව (නිදහස් චතුරශ්‍රය) (ජංගම ගිණුම් අංක 83591633) | 3 | 4,091 | 453 |
| (3) අත් මුදල් | | 15 | 15 |
| (4) ඉතුරුම් ගිණුම | 2,161 | | |
| මුලු එකතුව | 2,310 | 2,235 | 2,038 |
| සටහන අංක:05 | | | |
| මුදල් හා සමානයන් - ආයෝජන (කෙටිකාලීන) | | | |
| (1) ස්ථාවර තැන්පතු - ලංකා බැංකුව (නිදහස් චතුරශ්‍රය) (83326167) | 11,232 | 10,721 | 10,000 |
| (2) ස්ථාවර තැන්පතු - ලංකා බැංකුව (නිදහස් චතුරශ්‍රය) (83301038) | 5,299 | 5,063 | 4,000 |
| (3) ස්ථාවර තැන්පතු - ලංකා බැංකුව (නිදහස් චතුරශ්‍රය) (85326186) | 4,395 | 4,224 | |
| (4) ස්ථාවර තැන්පතු - ලංකා බැංකුව (නිදහස් චතුරශ්‍රය) (87555504) | 10,000 | | |
| මුලු එකතුව | 30,926 | 20,008 | 14,000 |

මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන් (සම්බන්ධයි)

| | 2021<br>රු. '000 | 2020<br>රු. '000 | 2019<br>රු. '000 |
|---|---|---|---|
| සටහන අංක:06 | | | |
| වෙළඳ සහ අනෙකුත් ලැබිය යුතු දෑ | | | |
| ලැබිය යුතු ලියාපදිංචි ගාස්තු | | 943 | 3,731 |
| ලැබිය යුතු වැට් බදු (ගෙවීම් ඉක්මවා) | 250 | 250 | |
| ශ්‍රී ලංකා ඉංජිනේරු ආයතනය | 237 | | |
| ලැබිය යුතු ස්ථාවර තැන්පතු පොලී | 79 | | |
| | 567 | 1,194 | 3,731 |
| සටහන අංක:07 | | | |
| පූර්ව ගෙවීම් | | | |
| තොරතුරු තාක්ෂණ වියදම් | 78 | | 30 |
| ජල තැන්පතු | 3 | 3 | |
| සේවක අර්ථසාධක අරමුදල | | 17 | |
| සේවක භාර අරමුදල | | 3 | |
| මුලු එකතුව | 81 | 23 | 30 |
| සටහන අංක:08 | | | |
| දේපල, යන්ත්‍රෝපකරණ සහ උපකරණ<br>කරුණාකර පිටු අංක 21 බලන්න | | | |
| සටහන අංක: 09 | | | |
| වෙනත් ප්‍රතිපාදන සහ ගෙවිය යුතු දේ | | | |
| (1) විගණන ගාස්තු සඳහා ප්‍රතිපාදන | 106 | 150 | 75 |
| (2) ගෙවිය යුතු PAYE බදු | | 18 | 17 |
| (3) වෙනත් ගෙවීම් | 54 | 26 | 7 |
| (4) ගෙවිය යුතු ආදායම්බදු | 1,255 | 1,329 | 1,086 |
| (5) ගෙවිය යුතු සේවක අර්ථසාධක අරමුදල | 81 | | |
| (6) ගෙවිය යුතු සේවක භාර අරමුදල | 12 | | |
| (7) ලියාපදිංචි ගාස්තු අත්තිකාරම් ඉංජිනේරු කාර්මික | 20 | | |
| මුලු එකතුව | 1,528 | 1,523 | 6,188 |

මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන් (සම්බන්ධයි)

දේපල, යන්ත්‍රෝපකරණ සහ උපකරණ

සටහන අංක: 08

| පිරිවැය | 2021.01.01 දිනට ශේෂය රු. '000 | එකතු කිරීම් රු. '000 | බැහැර කිරීම / ගැලපුම් රුපියල් '000 | 2021.12.31 දිනට ශේෂය රු. '000 |
|---|---|---|---|---|
| ගෘහභාණ්ඩ | 3,041 | | - | 3,041 |
| කාර්යාල උපකරණ | 107.69 | 47 | | 155 |
| පරිගණක සහ උපාංග | 673 | 268 | - | 941 |
| මුලු එකතුව | 3,822 | 315 | - | 4,137 |

| ක්ෂය වීම | 2021.01.01 දිනට ශේෂය රු. '000 | එකතු කිරීම් රු. '000 | බැහැර කිරීම් / ගැලපුම් රු. '000 | 2021.12.31 දිනට ශේෂය රු. '000 |
|---|---|---|---|---|
| ගෘහ භාණ්ඩ හා කාර්යාල උපකරණ | 709 | 609 | | 1,318 |
| කාර්යාල උපකරණ | 5 | 23 | | 28 |
| පරිගණක සහ උපාංග | 71 | 179 | - | 250 |
| මුලු එකතුව | 785 | 811 | - | 1,596 |
| | | | | |
| පොත් වල සඳහන් ශුද්ධ වටිනාකම | 3,037 | | | 2,541 |

සටහන අංක: 10
කල් දැමූ ආදායම

| | 2021.01.01 දිනට ශේෂය | වසර තුළ එකතු කිරීම් | වසර සඳහා ගාස්තු | | 2021.12.31 දිනට ශේෂය |
|---|---|---|---|---|---|
| | | | ක්ෂය වීම | නැවත ඇගයීම් ගැලපීම් / බැහැර කිරීම | |
| | රු. '000 | රු. '000 | රු. '000 | රු. '000 | රු. '000 |
| ගෘහ භාණ්ඩ උපාංග සහ කාර්යාල උපකරණ | 2,331 | | 608 | | 1,723 |
| පරිගණක සහ උපාංග | 76 | | 20 | | 56 |
| මුලු එකතුව | 2,407 | - | 628 | - | 1,779 |

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය / எனது இல. / My No. ඊඩබ්ලිව්/ඊ/ඊසීඑස්එල්/එෆ්/2021 | ඔබේ අංකය / உமது இல. / Your No. | දිනය / திகதி / Date 2022 ඔක්තෝබර් 04 දින

සභාපති

ශ්‍රී ලංකා ඉංජිනේරුවරුන්ගේ සභාව

ශ්‍රී ලංකා ඉංජිනේරුවරුන්ගේ සභාවේ 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව

---

යථෝක්ත වාර්තාව මේ සමඟ එවා ඇත.

ඩබ්. පී. සී. වික්‍රමරත්න

විගණකාධිපති

පිටපත් :-

01. ලේකම් - වාරිමාර්ග අමාත්‍යාංශය
02. ලේකම් - මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශය

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව. இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை. No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34 | +94 11 2 88 72 23 | ag@auditorgeneral.gov.lk | www.naosl.gov.lk

# ජාතික විගණන කාර්යාලය
## தேசிய கணக்காய்வு அலுவலகம்
## NATIONAL AUDIT OFFICE

මගේ අංකය / எனது இல. / My No. } අයිඩබ්ආර්/ඒ/ටීසිඑස්එල්/එෆ්ඒ/2021 | ඔබේ අංකය / உமது இல. / Your No. } | දිනය / திகதி / Date } 2022 ඔක්තෝබර් 04 දින

සභාපති

ශ්‍රී ලංකා ඉංජිනේරුවරුන්ගේ සභාව.

**ශ්‍රී ලංකා ඉංජිනේරුවරුන්ගේ සභාවේ 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව**

---

**1. මූල්‍ය ප්‍රකාශන**

**1.1 තත්ත්වාගණනය කළ මතය**

ශ්‍රී ලංකා ඉංජිනේරුවරුන්ගේ සභාවේ 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශන වලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (6) ව්‍යවස්ථාව ප්‍රකාරව මාගේ වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලැබේ.

මාගේ වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණු වලින් වන බලපෑම හැර, සභාවේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

නො. 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව | இல. 306/72, பொல்தூவ வீதி, பத்தரமுல்லை, இலங்கை. | No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34 | +94 11 2 88 72 23 | ag@auditorgeneral.gov.lk | www.naosl.gov.lk

**1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

---

(අ) ඉකුත් වර්ෂයේ ආදායම් බදු ලෙස ගෙවා තිබුණු රු.401,257 ක්ද ඇතුලත්ව සමාලෝචිත වර්ෂයේ ආදායම් බදු ලෙස රු. 1,656,196 ක් සමාලෝචිත වර්ෂයේ සමස්ථ බදු වගකීම ලෙස මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි.

(ආ) ලැබිය යුතු සාමාජික ගාස්තු රු.642,000 ක් ඇතුලත් රු.18,127,000 ක පමණ සාමාජික ගාස්තුවක් ආදායම් ලෙස මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණද, මෙකී සාමාජික මුදල් ගණනය කිරීමට පදනම් වූ සාමාජික ලේඛනය විගණනයට ඉදිරිපත් නොකෙරුණි. මෙම නිසා මෙකී සාමාජික ගාස්තු ආදායමේ නිවැරදිතාවය විගණනයේදී පරීක්ෂා කල නොහැකි විය.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3 සභාවේ 2021 වාර්ෂික වාර්තාවේ ඇතුළත් අනෙකුත් තොරතුරු**

---

මෙම විගණන වාර්තාවේ දිනට පෙර මා ලබාගත් සභාවේ 2021 වාර්ෂික වාර්තවේ ඇතුළත් කර ඇති නමුත් මූල්‍ය ප්‍රකාශන සහ ඒ පිළිබඳව වූ මගේ විගණන වාර්තාවේ ඇතුළත් නොවන තොරතුරු, අනෙකුත් තොරතුරු යන්නෙන් අදහස් වේ. මෙම අනෙකුත් තොරතුරු සඳහා කළමනාකරණය වගකිව යුතුය.

මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් වූ මගේ මතයෙන් අනෙකුත් තොරතුරු ආවරණය නොකරන අතර මම ඒ පිළිබඳ කිසිදු ආකාරයක සහතිකවීමක් හෝ මතයක් ප්‍රකාශ නොකරමි.

මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මගේ විගණනයට අදාළව, මගේ වගකීම වන්නේ ඉහත හඳුනාගත් අනෙකුත් තොරතුරු ලබා ගත හැකි වූ විට කියවීම සහ එසේ කිරීමේදී අනෙකුත් තොරතුරු මූල්‍ය ප්‍රකාශන සමඟ හෝ විගණනයේදී හෝ වෙනත් ආකාරයකින් ලබාගත් මගේ දැනුම අනුව ප්‍රමාණාත්මක වශයෙන් නොගැලපෙනවාද යන්න සලකා බැලීමයි.
මෙම විගණක වාර්තාවේ දිනට පෙර මා ලබාගත් අනෙකුත් තොරතුරු මත හා මා විසින් කරන ලද කාර්යයන් මත පදනම්ව, මෙම අනෙකුත් තොරතුරු ප්‍රමාණාත්මක වශයෙන්

පිටුව 2 | 7

වැරදි ලෙස දක්වා ඇති බව මම නිගමනය කරන්නේ නම්, එම කරුණ මා විසින් වාර්තා කිරීමට අවශ්‍ය වේ. මේ සම්බන්ධයෙන් මට වාර්තා කිරීමට කිසිවක් නැත.

## 1.4 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

---

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, සභාව අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය සභාව ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා සභාවේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

සභාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, සභාවේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.5 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

---

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම

මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.
- අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.
- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.
- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් සභාවේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.
- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම අගයන ලදී.

පිටුව 4 | 7

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරමි.

2. **වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳ වාර්තාව**

---

2.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුලත් වේ.

2.1.1 මාගේ වාර්තාවේ තත්ත්වාගණනය කල මතය සඳහා පදනම් කොටසේ විස්තර කර ඇති කරුණුවලින් වන බලපෑම හැර, 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12(ඉ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවන් අනුව, විගණනය සඳහා අවශ්‍ය සියලු තොරතුරු සහ පැහැදිලි කිරීම් මා විසින් ලබාගන්නා ලද අතර, මාගේ පරීක්ෂණයෙන් පෙනී යන ආකාරයට නිසි මූල්‍ය වාර්තා සභාව පවත්වාගෙන ගොස් තිබුණි.

2.1.2 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඈ)(iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

2.1.3 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1) (ඈ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද පහත නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

2.2 අනුගමනය කරන ලද ක්‍රියාමාර්ග සහ ලබා ගන්නා ලද සාක්ෂි මත හා ප්‍රමාණාත්මක කරුණුවලට සීමා කිරීම තුල, පහත සඳහන් ප්‍රකාශ කිරීමට තරම් කිසිවක් මාගේ අවධානයට ලක් නොවීය.

2.2.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12(ඈ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව සභාවේ පාලක මණ්ඩලයේ යම් සාමාජිකයෙකුට සභාවට සම්බන්ධවී යම් ගිවිසුමක් සම්බන්ධයෙන් සෘජුව හෝ අනාකාරයකින් සාමාන්‍ය ව්‍යාපාරික තත්වයෙන් බැහැරව සම්බන්ධයක් ඇති බව.

2.2.2 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12(ඊ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පහත සඳහන් නිරීක්ෂණ හැර යම් අදාල ලිඛිත නීතියකට හෝ සභාවේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානවලට අනුකූල නොවන ලෙස ක්‍රියා කර ඇති බව.

| නීතිරීති / විධානයට යොමුව | නිරීක්ෂණ |
| --- | --- |
| (ඇ) **2018 අංක 19 දරණ ජාතික විගණන පනත** | |
| (i) පනතේ 39.2 වගන්තිය | 2020 වර්ෂය සඳහා ඉදිරිපත් කර ඇති විස්තරාත්මක විගණකාධිපති වාර්තාවේ පෙන්වා දී ඇති නිර්දේශ ක්‍රියාත්මක කිරීම පිළිබද මාස 03 ක් ඇතුලත විගණකාධිපති වෙත වාර්තා කල යුතු වුවද සභාව විසින් එසේ සිදු කර නොතිබුණි. |
| (ආ) **2017 අංක 04 දරන ශ්‍රී ලංකා ඉංජිනේරුවරුන්ගේ සභාවේ පනත** | |
| (i) පනතේ 12 ඡේදය | ඉංජිනේරු වෘත්තිකයන්ගේ වෘත්තීය වැරදි හැසිරීම්වලට අදාළව යම් කාරණා පිළිබදව පරීක්ෂණ පැවැත්විය යුතු වුවද ඉංජිනේරු වෘත්තියේ නියැලෙන වෘත්තිකයන් විසින් කරනු ලබන වැරදි නියාමනය කිරීම සඳහා මෙතෙක් කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි. |
| (ii) පනතේ 14 වන ඡේදයේ 15 වන හා 18 වන වගන්ති | ඉංජිනේරු වෘත්තිකයෙකු ලෙස ලියාපදිංචි වී ඇත්නම් මිස එම ඉංජිනේරු වෘත්තිකයා ඉංජිනේරු වෘත්තිය සම්බන්ධ කටයුතුවල නියැලීම සිදු නොකළ යුතුය. කෙසේ වුවද සමාලෝචිත වර්ෂය අවසානයට ශ්‍රී ලංකා ඉංජිනේරුවරුන්ගේ ආයතනයේ (IESL) හා ශ්‍රී ලංකා සංස්ථාපිත ඉංජිනේරු ආයතනයේ (IIESL) වෘත්තිකයින් පිළිවෙලින් 20,248 ක් හා 8,000 ක් වුවද ඉංජිනේරු සභාවේ |

| | |
|---|---|
| | වෘත්තිකයින් 18,127 දෙනෙකු පමණක් ලියාපදිංචි වී තිබූ අතර ඒ සම්බන්ධව සම්බන්ධිත පාර්ශවය දැනුවත් කිරීම හා ලියාපදිංචිවීමකින් තොරව ඉංජිනේරු වෘත්තියේ නියැලෙන පුද්ගලයින් හදුනා ගැනීමට හැකි යාන්ත්‍රනයක් සකස් කර ක්‍රියාත්මක කර නොතිබුණි. |
| (iii) පනතේ බලතල (එ) | ඉංජිනේරු වෘත්තිකයන්ගේ වෘත්තීය වැරදි හැසිරීම් සම්බන්ධයෙන් විනය පරීක්ෂණ පැවැත්වීම පිළිබද ක්‍රියා පටිපාටියක් තීරණය කළ යුතු වුවද එසේ වෘත්තීය වැරදි හැසිරීම් සම්බන්ධයෙන් ක්‍රියා කළ යුතු අකාරය මෙතෙක් නිශ්චය කර නොතිබුණි. |
| (ඇ) ශ්‍රී ලංකා ප්‍රජාතන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සඳහන් මුදල් රෙගුලාසි 395 (ආ) සහ (ඇ) | බැංකු සැසඳුම් ප්‍රකාශයන් සෑම මසකම ඊලඟ මාසයේ 15 දිනට පෙර පිළියෙල කර විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු වුවද , බැංකු සැසඳුම් ප්‍රකාශයන් පිළියෙල කළ දිනය දක්වා නොතිබුණු බැවින් නියමිත කාල සීමාව තුළ බැංකු සැසඳුම් පිළියෙල කර ඇති බවට තහවුරුවක් නොවුණි. |

2.2.3 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12(උ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව සභාවේ බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූල නොවන ලෙස කටයුතු කර ඇති බව.

2.2.4 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12(ඌ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව සභාවේ සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ අදාළ නීතිරීති වලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර නොමැති බව

ඩබ්ලිව්. පී. සී. වික්‍රමරත්න
විගණකාධිපති